2025-01

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

තෙවන වාර පරීක්ෂණය - 2024 | 7 ශ්‍රේණිය | කාලය පැය 01

- ➢ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- ➢ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න

Learning Resource Center
R
De Mazenod College
Kandana

1) පස සොදාපාළු වැලැක්වීමට පස ආවරණය වන සේ වගා කිරීමට සුදුසු ශාකයකි.
   1. අඹ
   2. දෙහි
   3. පොල්
   4. වට්ටක්කා

2) විසිතුරු පත්‍රික ශාකයක් ලෙස ගෙවතු වල වගා කෙරේ,
   1. වද
   2. ඩ්‍රැසීනා
   3. රෝස
   4. බෝගන්විලා

3) සතුන්ට දෙනු සාන්ද්‍ර ආහාර වර් ගයකි.
   1. පොල් පුන්නක්කු
   2. තෘණ වර් ග
   3. කොස් අතු
   4. එළවළු හා පලතුරු කොටස්

4)  සංකේතයෙන් දැක්වෙන්නේ,
   1. ආලෝක විමෝචක ඩයෝඩයකි
   2. වියළි කෝෂයකි
   3. ස්විච්යකි
   4. ධාරිත්‍රකයකි

5) තාවකාලික විද්‍යුලිය ගබඩා කර ගැනීමට භාවිත වන උපාංගයකි.
   1. ස්විච
   2. ධාරිත්‍රක
   3. ආලෝක විමෝචක ඩයෝඩ
   4. ප්‍රතිරෝධක

6) සතුන්ට ලබාදෙන ආහාර වර්ග තීරණය කිරීමේදී සලකා බැලෙන සාධකයක් නොවන්නේ,
   1. සතුන් ඇතිකරන ආකාරය
   2. සත්ත්ව වර්ගය
   3. සතුන් පසුවන වර්ධන අවධිය
   4. සත්ත්වයාගේ ශරීර වර්ණය

7) ආහාර අමුද්‍රව්‍යයක වර්ණය වෙනස්වීම වැළැක්වීමට යොදන පෙර ප්‍රතිකර්මයක් නොවන්නේ,
   1. අමුද්‍රව්‍ය ජලයෙන් සෝදා වාතයට විවෘතව තැබීම
   2. දෙහි ඇඹුල් තැවරීම
   3. පොල්කිරිවල ගිල්වීම
   4. සීනි සිරප්වල ගිල්වීම

8) වක්‍රව ලබාදෙන වාෂ්පයෙන් තැම්බීම සිදුකරන ආහාරයකි.
   1. පාන්
   2. වටලප්පන්
   3. ඉඳි ආප්ප
   4. කේක්

9) නොගැඹුරු තෙලේ බැදීමෙන් පිසගත නොහැකි ආහාර වර්ගයකි.
   1. කට්ලට්
   2. ලූනු
   3. බිත්තර
   4. ඉහත කිසිවක් නොවේ

10) ආහාර අමුද්‍රව්‍යයක් පිටි බවට පත්කිරීමට යොදාගත හැක.
1. කුරහන් ගල
2. කොලැන්ඩර
3. හිරමණය
4. මිශ්‍රකරණය

11) රූප හා අක්ෂර සහිත පෝස්ටරයක් සැකසීමේදී අවධානය යොමු කළ යුතු වන්නේ,
1. අක්ෂර වල ප්‍රමාණය
2. පසුබිමට යොදන වර්ණය
3. රූප සඳහා යොදන වර්ණය
4. ඉහත සියල්ලම

12) යම් වස්තුවක දිග, පළල හා උස සමානුපාතිකව දැක්වෙන සේ අදින චිත්‍ර සටහන හඳුන්වන්නේ,
1. රූපීය පෙනුම ලෙසය
2. දළ සටහන ලෙසය
3. කටු සටහන ලෙසය
4. ඉහත කිසිවක් නොවේ

13) අවමය එක් අයෙකුද, උපරිමය කොටස් කරුවන් 50 කගේද සහභාගීත්වයෙන් ආරම්භ කළ හැකි ව්‍යාපාර ක්‍රමය හඳුන්වන්නේ,
1. කුඩා පෞද්ගලික සමාගම්
2. තනි පුද්ගල ව්‍යාපාර
3. දෙපාර්තමේන්තු
4. හවුල් ව්‍යාපාර

14) හවුල් ව්‍යාපාරයක ඇති අවාසියකි,
1. හවුල් කරුවන් මත ගැටුම් ඇතිවීම
2. කිහිපදෙනෙකු ප්‍රාග්ධනය යෙදීම
3. හවුල් ව්‍යාපාර වලට බලපාන නීති රීති අවම වීම
4. ඉහත සියල්ලම

15) භාණ්ඩයක ගුණාත්මක බව නිරූපණය කෙරෙන සාධකයකි,
1. මිල අධික වීම
2. හොඳ මතුපිට පෙනුමක් තිබීම
3. ප්‍රමිති සහතික ලබා තිබීම
4. මිල අඩුවීම

16) SPDT ස්විච භාවිතාවන අවස්ථාවකි.
1. නිවසක විදුලි සීනුව
2. මෝටර් රථ තලාවක
3. මෝටර් රථවල සංඥා ලාම්පු පාලනය කිරීමට
4. මෝටරයක චලිත දිශාව වෙනස් කිරීමට

17) ස්ථිර ප්‍රතිරෝධකයක ඇති වර්ණ තීර ගණන,
1. 3කි
2. 4කි
3. 5කි
4. 6කි

18) නිෂ්පාදනයක් සිදුකිරීම සඳහා අවශ්‍ය මූලික කරුණකි,
1. ප්‍රාග්ධනය
2. භූමිය
3. ශ්‍රමය
4. ඉහත සියල්ලම

19) භූමි අලංකරණයේදී යොදාගන්නා දෘඪ උපාංගයකි
1. පාලම
2. ශාක බෝඩර
3. ශාක වැටි
4. මල් පිපෙන ශාක

20) මුළු තැන්ගෙයක තිබිය යුතු අත්‍යවශ්‍ය ලක්ෂණයක් නොවන්නේ,
1. හොඳින් වාතාශ්‍රය ලැබීම
2. පානීය ජල සැපයුමක් තිබීම
3. අපද්‍රව්‍ය ඉවත් කිරීමට අවශ්‍ය පහසුකම් තිබීම
4. මිල අධික උපකරණ හා ආම්පන්න තිබීම

II කොටස

ප්‍රශ්න 03කට පමණක් පිළිතුරු සපයන්න.

1)

1. භූමි අලංකරණයේදී ශාක වලින් අපේක්ෂා කෙරෙන කාර්යයන් 3ක් ලියන්න. ල.3
2. භූමි අලංකරණය සඳහා යොදා ගන්නා දෘඪ උපාංග 2ක් සඳහන් කරන්න. ල.2
3. ගෙවත්තක සතුන් ඇති කිරීමේ වැදගත්කම කරුණු 5කින් දක්වන්න. ල.5

2)

1. ආහාර පිසීමේ විවිධ ක්‍රම කීපයක් පහත දැක්වේ. එම ක්‍රම වලට භාජනය කිරීමෙන් පිසගන්නා ආහාර වර්ග 1 බැගින් ලියන්න.
   i. බ්ලාන්ච් කිරීම -
   ii. ජලයේ බහා තැම්බීම -
   iii. පෝරණුවේ පිළිස්සීම -
   iv. ගැඹුරු තෙලේ බැදීම -
   v. නොගැඹුරු තෙලේ බැදීම - ල.5
2. පිසින ලද ආහාරයක් පිළිගැන්වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 5ක් ලියන්න. ල.5

3)

1. අතීතයේදී උත්සව අවස්ථා හැඩගැන්වීම සඳහා යොදාගත් සාම්ප්‍රදායික සැරසිලි සැකසීමට යොදාගෙන ඇති අමුද්‍රව්‍ය 2ක් ලියන්න. ල.2
2. පණිවිඩයක් සන්නිවේදනය කිරීමට රූප හා සංකේත යොදා ගැනීමේ වැදගත්කම කරුණු 2කින් දක්වන්න. ල.2
3. භූමි අලංකරණයේදී සැලසුම් ඇඳීමට පහත උපාංග සඳහා භාවිතා වන සලකුණු අඳින්න.
   i. ආරුක්කු
   ii. මාවත්
   iii. උද්‍යාන කුඩ ල.6

4)

1. තනි පුද්ගල ව්‍යාපාරයක වාසි 2ක් ලියන්න. ල.2
2. වෙළඳපොළක සිදුවිය හැකි විශමාචාර ක්‍රියා 2ක් ලියන්න. ල.2
3. නිෂ්පාදනයක් සිදුකිරීමට විවිධ යෙදවුම් අවශ්‍ය වේ. පහත නිෂ්පාදන සිදුකිරීම අවශ්‍ය යෙදවුම් 3 බැගින් සඳහන් කරන්න.
   i. පාසල් බෑගයක්
   ii. ලී මේසයක් ල.6

5)

1. ගෘහ අලංකරණය සඳහා යොදාගත හැකි නිර්මාණයක් සැකසීමට භාවිත කළ හැකි සරල අමුද්‍රව්‍ය 10ක් නම් කරන්න. ල.5
2. කීරළ හැඩැති කඩදාසි පබළු වලින් සිදුකළ හැකි ගෘහ අලංකරණය සඳහා ගැළපෙන නිර්මාණයක් ඇඳ දක්වන්න. ල.5